ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

ප්‍රථම අඛණ්ඩ ඇගැයීම් පරීක්ෂණය – 2006

කම්කරු නීතිය – LWU 4323 / 4314/ 3323

කාලය - විනාඩි 40 යි

---

දිනය: 2006 සැප්තැම්බර් මස 08 වන දින    වේලාව: ප.ව. 1.30 සිට ප.ව. 2.10 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

1. (අ) "පරිවාසිකයෙකුගේ සේවය සතුටුදායක වන්නේ ද නැද්ද යන්න තීරණය කරන එකම විනිශ්චයකරු වන්නේ සේවා යෝජකයාය".

   ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න

   (ආ) 2006 ජනවාරි මස 1 වන දින සිට පැරකුම් සහ සමාගමේ සහකාර ගිණුම් ලිපිකරුවකු ලෙස නාමල් සේවයේ යොදවනු ලැබීය. ඔහුගේ පත්වීම මාස 6 ක පරිවාස කාලයකට යටත් විය. 2006 ජූලි 1 වන දින හය මාසයක කාලය අවසන් වූ නමුත් නාමල්ව සේවයේ ස්ථිර කිරීම හෝ සේවයෙන් ඉවත් ව යන ලෙස ඔහුට දැනුම් දීමක් හෝ නොකරනු ලැබීය.

   පැරකුම් සමාගම තුළ සිය තත්ත්වය පිළිබඳව නාමල්ට උපදෙස් දෙන්න.

2. සේවා ගිවිසුමක් හා සේවා සඳහා ගිවිසුමක් අතර වෙනස තීරණය කිරීම පිණිස මෑත කාලයේ දී අධිකරණ විසින් 'මිශ්‍ර' හෝ 'බහුවිධ' පරීක්ෂණය යොදාගෙන ඇත. මේ අරමුණ සඳහා භාවිතා කළ කලින් පරීක්ෂණවල පැවති අඩුපාඩු සාර්ථක ලෙස නිවැරදි කිරීමට මෙම නව පරීක්ෂණය සමත් වී ඇත.

   අදාල නඩු තීරණ ඇසුරෙන් මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න

හිමිකම් ඇවිරිණි

***********